# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
## ඉදිකිරීම්

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**ඉදිකිරීම් කටයුතුවල තවදුරටත් වර්ධනයක් පිළිබිඹු කරමින්, ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, 2026 ජුනි මාසයේ දී දර්ශකාංක 60.0ක අගයක් වාර්තා කළේය.** පසුගිය මාසවල දී ප්‍රදානය කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මේ සඳහා හේතු වූ බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙක් සඳහන් කළහ.

පසුගිය මාසයේ වාර්තා වූ ඉහළ ව්‍යාපෘති ප්‍රදානය කිරීම්වලට පසුව, ජුනි මාසය තුළ දී නව ඇණවුම් දර්ශකය අඩු වේගයකින් වුවද තවදුරටත් වර්ධනය විය. ඉදිකිරීම් සමාගම් විසින් සේවක බඳවා ගැනීම් තවදුරටත් වැඩි කිරීමත් සමඟ සේවා නියුක්ති දර්ශකය ජුනි මාසයේ දී ඉහළ ගියේය. කෙසේ වෙතත්, පවතින පුහුණු සේවක හිඟය පිළිබඳව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙක් අවධාරණය කළහ. ඉදිකිරීම් කටයුතුවල අඛණ්ඩ වර්ධනයත් සමඟ තොග මිලදී ගැනීම් දර්ශකය ද මෙම මාසය තුළ දී ඉහළ ගියේය. එසේ වුවද, විශේෂයෙන්ම බිටුමන් (තාර) වැනි ප්‍රධාන අමුද්‍රව්‍යවල පවතින හිඟය ඉදිකිරීම් කටයුතුවල වේගය සීමා කිරීමට හේතු වූ බව ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙක් වාර්තා කළහ. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ජුනි මාසයේදී ද ඉහළ මට්ටමක පැවතුණි.

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | 2026 මැයි | 2026 ජුනි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)** | **59.1** | **60.0** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 63.6 | 54.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 56.1 | 61.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 59.1 | 60.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 71.2 | 62.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අමුද්‍රව්‍ය හිඟවීමේ අවදානමත් සමග ක්ෂේත්‍රයේ වර්ධනයට ඇති බාධාවන් හමුවේ වුවද, ඉදිකිරීම් ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මකවීම හේතුවෙන් ඉදිරි කාර්තුව සඳහා ඉදිකිරීම් සමාගම්වල ව්‍යාපාරික අපේක්ෂා ධනාත්මකව පවතියි.

ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)

**60.0**

2026 ජුනි




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ප්‍රංශය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ජර්මනිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| අයර්ලන්තය | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ඉතාලිය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 ජූලි 31 වන දිනට*

[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන
තොග මිලදී ගැනුම් : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය
අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.